**ජාතික ශිල්ප සභාව - 2020**
------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ශිල්ප සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 (47) අනුව සාධාරණ වටිනාකමේ සැලකිය යුතු වෙනස්වීම් තිබෙන දේපළ, පිරියත හා උපකරණ අයිතම සඳහා වාර්ෂික ප්‍රත්‍යාගණනයක් අවශ්‍ය වේ. නමුත්, සභාව විසින් දීර්ඝ කාල පරිච්ඡේදයක සිට පවතින වත්කම් සඳහා ප්‍රත්‍යාගණනය කිරිමක් සිදු කර නොතිබුණි. | වත්කම් කළමණාකරන චක්‍රලේඛ අංක 04/2018 අනුව ප්‍රත්‍යාගණන කමිටු පත්කර සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව. | වටිනාකමේ සැලකිය යුතු වෙනස්වීම් තිබෙන දේපළ, පිරියත හා උපකරණ අයිතම සඳහා වාර්ෂික ප්‍රත්‍යාගණනයක් කලයුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් 08 කට අදාළ ශේෂයන් ස්ථාවර වත්කම් උපලේඛන සමඟ සැසඳීමේදී රු.37,958,623 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වත්කම් වෙනත් අයුරකින් සන්නිරීක්ෂණය කිරිම හෝ වටිනාකම තහවුරු කර ගැනීමට අදාළ වත්කම් සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවිණි. | ස්ථාවර වත්කම් වලට අදාල වෙනස දිගුකාලයක සිට පැවත එන බැවින් එම වෙනස සොයා ගැනිමට නොහැකි බවත්, සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල සටහන් කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් සහ උපලේඛන අතර වෙනස්කම් හඳුනාගෙන වත්කම් ප්‍රත්‍යාගණනය කර නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රු.1,635,380 ක් වූ පුනරාවර්තන වියදම් ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වත්කම් වැඩියෙන් දක්වා තිබුණු අතර, වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වියදම් ප්‍රමාණාත්මක හා වත්කම් වටිනාකම වැඩිවීමක් සිදුවන බැවින් ප්‍රාග්ධනිත කල බව | ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් පමණක් වත්කමට එකතු කලයුතුය |
| (ඇ) | ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත් කරුවන්ගෙන් රඳවාගත් රු.888,834 ක් හා යන්ත්‍ර අළුත්වැඩියාව සඳහා රඳවාගත් රු.117,512 ක් වශයෙන් එකතුව රු.1,006,346 ක් සමාලෝචිත වර්ෂයේ වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මෙම රඳවාගැනීම් මුදලින් සම්පූර්ණ මුදලම ගෙවීම් කිරිම අවිනිශ්චිත බැවින් ඒවා ප්‍රාග්ධනිත නොකල බව හා .අදාල වගකීම් කාලය සම්පූර්ණ වූ පසු මෙම රඳවා ගත් මුදල් ගෙවීම් කිරීමේදී එම මුදල් ප්‍රාග්ධනිත කර වත්කම් ලෙස ගිනුම්ගත කරන බව | වර්ෂයට අදාලව කොන්ත්‍රාත්කරුවන් ගෙන් රඳවාගත් මුදල් වගකීම් මෙන්ම වත්කම් ලෙසද සැලකිය යුතුය. |

**1.6 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති 2020/1 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ II කොටස 9 ඡේදය | ශිල්ප සභාවේ රජයේ මුදල් භාරකාරීත්වය පිළිබඳ ඇප තැබිය යුතු නිලධාරීන් 06 දෙනෙකු විසින් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. | ඇප මුදල් තැන්පත් කළ යුතු නිළධාරීන් කවුරුන්ද යන්න හඳුනාගෙන ඉදිරියේදී ඇප තැබීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව. | ඇප තැබිය යුතු නිලධාරින්ගෙන් ඇප ලබාගැනීමට කටයුතු කලයුතුය |
| (ආ) | මුදල් රෙගුලාසි 756 (6) හා 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 11.3 ඡේදය | 2019 වර්ෂයේ සභාවේ පුහුණු මධ්‍යස්ථාන 109 කින් මධ්‍යස්ථාන 72 ක භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණු අතර, 2020 සඳහා සමීක්ෂණ පවත්වා නොතිබුණි | 2019 අදාල භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමේදී කොරෝනා වසංගතය හේතුවෙන් පිට පලාත් වෙත යාමේ අවධානමක් පැවතීම හේතුවෙන් මෙම තත්වය ඇති වූ බව හා 2020 ට අදාල පුහුණු මධ්‍යස්ථාන භාණ්ඩ සමීක්ෂණය සිදු කර අදාල වාර්තා නිසි පරිදි විගණනය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සිදු කලයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2003 ඔක්තෝබර් 28 දිනැති පීඊඩී 17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2020 පෙබරවාරි 01 සිට පෙබරවාරි 16 දින දක්වා ඉන්දියාවේ පැවති 34 වන සූරාජ් කුණ්ඩ් ජාත්‍යන්තර හස්ත කර්මාන්ත ප්‍රදර්ශනයට සහභාගී වීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු විසින් අදාළ අයදුම්පත්‍රය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ ලබා ගැනීමෙන් තොරව ගුවන් ටිකට් පත් ගාස්තුව, සංයුක්ත දීමනා හා අනෙකුත් වියදම් සඳහා රු.783,230 ක් වියදම් දරා තිබුණි. | විදේශ අලෙවි ප්‍රදර්ශන සඳහා ක්‍රියාකාරී සැලැස්මෙහි මුදල් වෙන් කර ප්‍රාග්ධන අරමුදලින් අදාළ වියදම් දැරීමට ගරු මුදල් ඇමතිතුමා අනුමත කර ඇති අවස්ථාවක එක් එක් විදේශ ප්‍රදර්ශන සඳහා වෙන වෙනම රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ගත යුතුද යන්න පිළිබද රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවෙන් පැහැදිලි කිරීමක් හා උපදෙස් ලබාගැනීමට කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යංශ ලේකම් වෙත 2020.07.17 දින ලිපිය යොමු කළදපිළිතුරු නොලැබුණු බැවින් නැවතත්2020.12.04 දින වේවැල්,පිත්තල, මැටි, ලී බඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ලේකම්තුමා වෙත ලිපියක් යොමු කර ඒ අනුව අමාත්‍යංශයේ අතිරේක ලේකම් විසින් අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ ලිපිය උපදෙස් සඳහා යොමු කර ඇති බව . | මෙම චක්‍රලේඛය ප්‍රකාරව පූර්ව අයදුම් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් විදේශ සංචාර සඳහා සහභාගී විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව | මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2018 වර්ෂයේ වාර්ෂික පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික වාර්තාව අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව | චක්‍ර ලේඛය ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කලයුතුය. |
| (ඉ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 සහ 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අතුරු අග්‍රිම ලබාගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්ය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතුය යන්න දක්වා තිබුණද, අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා සති 02 සිට මාස 03 දක්වා කාල පරාසයන් ලබාගෙන තිබූ අවස්ථා 30 ක් වූ අතර අතුරු අග්‍රිම පියවීමට පෙර නැවත අතුරු අග්‍රිම ලබාගෙන තිබුණි. | මෙවැනි තත්වයක් ඉදිරියේදී අවම කර ගැනීමට කටයුතු කරන බව | මෙම චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් ලබා දීමෙන් පසුව කාර්ය නිම වූ විගස අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,321,142-ක ඌනතාවයක්වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.688,033 ක්විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.633,109ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මුළුආදායම රු.42,801,274කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කාවන්තිස්සපුර ග්‍රාමා නිලධාරී වසමේ හෙක්ටයාර් 16187 ක් වූ රජයේ ඉඩමෙහි කාවන්තිස්සපුර කර්මාන්ත ගම්මානය ආරම්භ කර තිබුණි. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2013 නොවැම්බර් 28 දිනැති ලිපිය ප්‍රකාරව මෙම ඉඩම අවුරුදු 30 ක කාලයක් සඳහා දීර්ඝකාලීන බදු පදනම මත පවරා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇතත්,මේ දක්වා එම කාර්යය සිදු කර නොතිබුණි. මේ සඳහා වාර මුදල් වශයෙන් රු.720,000 ක් හා දඩ මුදල් වශයෙන් රු.60,000 ක් තිස්සමහාරාම ප්‍රදේශීය ලේකම් වෙත 2020 වර්ෂය තුළ ගෙවා තිබුණ අතර, අදාළ නඩත්තු සඳහා රු.876,869 ක් වශයෙන් එකතුව රු.1,656,869 ක් වැය කර තිබුණද, නීත්‍යානුකූල බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර, මෙම ගම්මානය ඵලදායී ආයෝජන කටයුත්තකට භාවිතා කර නොතිබුණි | 2021 හම්බන්තොට කාවන්තිස්සපුර ගම්මානය නිෂ්පාදන ගම්මානයක් ලෙස ඉදිරියේදී පවත්වාගෙන යාමට සැළසුම් කර ඇති බව | නීත්‍යානුකූල බදු ගිවිසුමක් අත්සන් කර ගම්මානය ඵලදායී ආයෝජන කටයුත්තකට භාවිතා කලයුතුය. |
| (ආ) | සියලුම හස්ත කර්මාන්ත ගම්මාන හඳුනාගෙන එම ගම්මාන වල යටිතල පහසුකම්, යන්ත්‍රෝපකරණ, අමුද්‍රව්‍ය උපකරණ නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන්, වෙළඳපොල අවශ්‍යතා යන සියළුම අංශ යටතේ සංවර්ධනය කිරීම සඳහා ගම්බිම් වැඩබිම් බවට පත් කිරීමේ වැඩසටහන යටතේ | 2020 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් යටතේ අලවල හා බියගම ගම්මාන දෙක සංවර්ධනය කිරීමට ප්‍රතිපාදන වෙන්කර ඉන් අලවල ගම්මානයේ ශිල්පීන්ට වැඩමඩුවක් ඉදිකර ගැනිම සඳහා රු. 1,584,000 ක සෙවිලි තහඩු හා රු 79200 ක | වැඩ සටහනේ අරමුණු ඉටුවන අයුරින් ක්‍රියා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2020 වර්ෂය සඳහා රු.4,000,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, ඉන් රු.3,431,018 ක් වැය කර තිබුණි. මේ යටතේ ගම්මාන 02 ක් සංවර්ධනය සඳහා සැලසුම් කර සකස් කර තිබුණි. නමුත්, අලවිල ගම්මානයේ ජීවත් වන ලියාපදිංචි ශිල්පීන් 100 ක් සඳහා තහඩු හා සිමෙන්ති මිලදී ගැනීම සඳහා රු.1,663,200 ක් වැය කර තිබුණි.. මෙම භාණ්ඩ බෙදා දීමේ උත්සවය සඳහා 2021 වර්ෂය තුළ රු.348,119 ක වියදමක් දරා තිබුණි. | මුදල රදාවඩුන්න වේවැල් ගම්මානය සඳහා වැඩමඩු ඉදිකිරීමට අවශ්‍ය සිමෙන්ති කොට්ට ලබා දීමට දරන ලද බව හා . ඔවුන්ගේ ශ්‍රම දායකත්වයෙන් එම වැඩමුළු ඉදිකිරීමට කටයුතු කරමින් පවතිනබව | |
| (ඇ) | ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්ක ශිල්ප සභා කාර්යාලය යටතේ ලියාපදිංචි වී සිටි ශිල්පීන් හතරදෙනෙකු විසින් 2019 වසරේදී ඉල්ලා තිබූ උපකරණ ලබාගැනීම සඳහා 2020 දෙසැම්බර් 28 දින අංක 399370 දරණ රු.81,380 වටිනා චෙක්පත තෝරාගත් ලංසුකරු වෙත 2021 ජනවාරි 21 දින ඉදිරිපත් කර තිබුණි.වසරකට වඩා වැඩි කාලයක් එනම් 2021 ජනවාරි 29 දින වන විටත් එම භාණ්ඩ අදාළ ශිල්පීන්ට ලබාදී නොතිබුණි මෙයට අමතරව ගාල්ල, මාතර හා මහනුවර දිස්ත්‍රික්ක වල උපකරණ ඉල්ලුම් කර තිබූ ශිල්පීන්ගේ ඉල්ලීම් ඉදිරිපත් වීමටත් ප්‍රථම ඒ සඳහා මිල කැඳවීම් කර තිබූ අවස්ථා විය. | පිළිතුරු ලබාදී නොමැත | ශිල්පීන්ගේ අවශ්‍යතා නොපමාව ඉටුකිරීමට කටයුතු කලයුතුය. |
| (ඇ) | කාවන්තිස්සපුර සවිය අලෙවි ගම්මානයේ අමුද්‍රව්‍ය රෝපණ වැඩසටහන යටතේ හණ පැළ 1,000 ක් රෝපණය කිරීම සඳහා රු.414,410 ක් වැය කර තිබුණි. ඇස්තමේන්තුගත මුදල තුළ රු.40,000 ක් වූ නඩත්තු වියදම් ඇතුළත් කර නොතිබුණද පැළ සිටුවා කිසිදු නඩත්තුවක් | හම්බන්තොට අමුද්‍රව්‍ය වගාවේ නඩත්තු කටයුතු සිදු කිරිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට දකුණු පලාත් සහකාර අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබා දී ඇති බව. | ව්‍යාපෘතියේ පසු විපරම් කිරීම් හා නඩත්තු කිරීම් නියමිත පරිදි සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොකිරීම හේතුවෙන් පැළ රෝපණය කර සති දෙකකට පසු පැළ මැලවී ගොස් තිබූ බව සභාවේ නිලධාරීවරයෙකු සිදු කළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වී තිබුණි. එසේම 2017 වර්ෂයේ ආලෝකගම හණ පැළ 4,000 ක් රෝපණය කර තිබුණද, 2019 වර්ෂය අවසන් වන විට කිසිඳු හණ පැළයක් භෞතිකව නොතිබුණු බව අභ්‍යන්තර විගණනය සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය වී තිබුණි. | | |
| (ඉ) | 2008 දෙසැම්බර් 23 දිනැති කැබිනට් පත්‍රිකා අංක 08/2322/349/015 දරන කැබිනට් තීරණය මඟින් හස්ත කර්මාන්ත මණ්ඩලයේ සේවකයන් 185 දෙනෙකු ශිල්ප සභාවට අනුයුක්ත කරගෙන තිබුණද, මණ්ඩලයේ ඉන්වෙන්ටරි අයිතම නීත්‍යානුකූලව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. පුහුණු මධ්‍යස්ථානවල වාර්ෂික ආදායම, වියදම හා වත්කම් පිළිබඳව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. නමුත් ශිල්ප සභාව විසින් ස්ථාන භාර නිලධාරීන් 87 දෙනෙකු සඳහා රු.46,346,838 ක මුදලක් වාර්ෂිකව වැය කරනු ලබයි | හස්ත කර්මාන්ත මණ්ඩලයේ සේවකයින් ජාතික ශිල්ප සභාවට පැවරීමෙන් අනතුරුව පත්කරන ලද කමිටුවක් මගින් ස්ථාවර වත්කම් හැර අනෙකුත් අයිතම පැවරීමක් සිදු කර ඇති බව හා පුහුණු මධ්‍යස්ථාන වල සිටින ස්ථාන භාර නිළධාරින් ආයතනයේ ස්ථිර සේවකයින් වන බැවින් ඔවුන් පුහුනු උපදේශක කාර්යයේ නිරත වන බැවින් ඔවුන් සඳහා රජය විසින් ස්ථිර වැටුප් ගෙවීම සඳහා මෙම මුදල දරනු ලබන බව. | ඉන්වෙන්ට්‍රි අයිතම නීත්‍යානුකූලව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කර යුතු අතරම පුහුණු මධ්‍යස්ථානවල වාර්ෂික ආදායම, වියදම වත්කම් හා වගකීම් පිළිබඳව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කලයුතුය. |
| (ඊ) | පුහුණු මධ්‍යස්ථාන සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් 2020 වර්ෂය සඳහා රු.මිලියන 3 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඉන් වැය කර ඇති මුදල රු.1,869,051 ක් වී තිබුණි. ප්‍රතිපාදන වෙන් කිරීම 2019 වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 2 කින් අඩු කර තිබුණි. පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා සලසා තිබූ රු.500,000 ක ප්‍රතිපාදනය වැය කර | 2020 වර්ෂය සඳහා අතුරු සම්මත ගිණුම මගින් වරින්වර ප්‍රතිපාදන වෙන් කරන ලදී. නමුත් එම ප්‍රතිපාදන භාණ්ඩාගාරය මගින් ලබා නොදීම මත අවසානයේ ලැබුනු මුදල් සහ අවසාන මාස හතරේ ප්‍රතිපාදන මත වාර්ෂික ඇස්තමේන්තුව සකස් කල බව හා ඒ අනුව 2019ට සාපේක්ෂව 2020 | ප්‍රතිපාදන උපරිම අයුරින් භාවිතා කිරීමටත් සියළුම මධ්‍යස්ථාන වල පුහුණුවීම් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කල යුතුය |

| | |
|---|---|
| නොතිබුණි. ශිල්ප සභාව සතුව පුහුණු මධ්‍යස්ථාන 112 ක් පැවතියද ඉන් මධ්‍යස්ථාන 41 ක පමණක් පුහුණු පාඨමාලා පවත්වා තිබුණි | වර්ෂයේ ප්‍රතිපාදන අඩු කල බවත් පුහුණු කරුවන් පුහුණු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කලද රටෙහි පැවැති තත්වය මත එම පුහුනුකිරීම් සිදු කිරීමට නොහැකි වූ බව. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාතේ හා පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ පිහිටි පුහුණු මධ්‍යස්ථාන 23 ක වාර්ෂික ආදායම රු.2,056,420 ක් වන අතර, වියදම රු.2,033,565 ක් වී තිබුණි. මෙම වියදම තුළ ඇතුළත් රු.1,847,261 ක් වූ කාර්මික වැටුපක් පුහුණු වන ආධුනිකයින්ට ගෙවා ඇතත්, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | ඕනෑම පුහුණු මධ්‍යස්ථානයක පුහුණුව අවසන් කරනු ලබන ආධුනිකයින් එකී පුහුනු මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගෙන නැවත තම නිෂ්පාදන කටයුතු වල කාර්මිකාවන් ලෙස නිරත වන බවත් එම නිෂ්පාදන අලෙවියෙන් ලැබෙන ආදායම මධ්‍යස්ථානයේ ගිණුමට බැර වන අතර ඉන් 10%ක් මුදලක් රඳවා ගෙන ඉතිරිය පලාත් නිලධාරින්ගේ විධිමත් අනුමැතිය යටතේ කාර්මික වැටුප් ලෙස ගෙවනු ලබන බව. | සියළු ගෙවීම් විධිමත් අනුමැතියක් මත ගෙවිය යුතුය |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ඡේදය ප්‍රකාරව වැඩ සඳහා පිරිවිතර සහ කොන්දේසි වලට අනුකූලව වැඩ ඉටු කර ඇති බවට වැඩ අවසන් කිරීමේ සහතිකයක් ලබාගත යුතු වුවත්, එසේ සහතිකයක් ලබා ගැනීමකින් තොරව එකතු වටිනාකම රු.1,904,844 ක් ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාව අළුත්වැඩියාව ඉදිකිරීම් පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කලයුතුය |
| (ආ) | 2006 ජනවාරි 25 දින අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය ප්‍රකාරව, ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාව | පිළිතුරු ලබාදී නොමැත | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කලයුතු අතරම නියමිත කාලසීමාවට අදාළව කාර්ය සාධන සුරක්ෂණ ලබා ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | අළුත්වැඩියාව ආරක්ෂක සේවා හා පවිත්‍රතා සේවාව ලබාගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තු වල වැඩ අවසන් කිරීම සඳහා නියමිත කාලසීමාවට අදාළව කාර්ය සාධන සුරක්ෂණ ලබාගෙන නොතිබුණි. | | |
| (ඇ) | හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා නව තාක්ෂණය හඳුන්වා දීමේ වැඩසටහන යටතේ විදුලි සකපෝරු ලබා ගැනීම සඳහා රු.2,475,000 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට වියදම් කර තිබුණ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 හා 8.12.3 වගන්ති ප්‍රකාරව සපයන ලද භාණ්ඩ කොන්ත්‍රාත් විධි විධානයන්ට අනුකූල බවට සහතික කර ගෙවීම් සිදු කිරීමට කටයුතු නොකර අදාළ භාණ්ඩ ලැබීමට පෙර සියලු මුදල් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් අදාළ භාණ්ඩ ලබාදිය හැකි දිනය 2021 පෙබරවාරි 15 දින බවට ඉල්ලීමක් කර තිබියදී 2020 දෙසැම්බර් 31 ගෙවීම් අනුමත කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය ප්‍රකාරව රු.123,750 ක් වූ කාර්ය සාධන සුරක්ෂණ ලබාගෙන නොතිබුණි. | මෙම සැපයුම්කරු මීට පෙරද ජාතික ශිල්ප සභාව සඳහා විදුලි සකපෝරු සකස් කර දී ඇති අතර මෙම ආයතනය සමග ඔහු විසින් ගොඩනගා ඇති විශ්වාසය මත පදනම්ව ඔහු අදාල කාර්යය සිදු කර ඇති බව හා . ඉදිරියේදී නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට උපදෙස් ලබාදී ඇති බව. | භාණ්ඩ කොන්ත්‍රාත් විධි විධානයන්ට අනුකූල බවට සහතික කිරීමට පෙර ගෙවීම් නොකල යුතු මෙන්ම මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණ ලබා ගත යුතුය. |
| (ඇ) | වරාගොඩ සෙරමික් පුහුණු මධ්‍යස්ථානයේ යන්ත්‍ර අයිතම් 18 ක් අළුත්වැඩියා කිරීම සඳහා රු.3,615,250 ක් වූ කොන්ත්‍රාත්තුවෙන් සියයට 35 ක් වූ වැඩ කොටස නිම නොකර තිබියදී අනෙකුත් වැඩ කොටස් සඳහා රු.2,232,737 ක් ගෙවා කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. මෙම අළුත්වැඩියා කරන ලද උපකරණ වෙනුවෙන් වගකීම් කාලයක් හෝ නඩත්තු කාලයක් සභාව විසින් ලබාගෙන නොතිබුණු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය ප්‍රකාරව රු.180,762 ක් කාර්ය සාධන සුරක්ෂණයද ලංසුකරු ඉදිරිපත් කර නොතිබුණි. | වරාගොඩ පුහුණු මධ්‍යස්ථානයේ යන්ත්‍ර 18 ක් අළුත්වැඩියාව සඳහා ලබා දුන් ඇනවුමේ අංක 18 අයිතමය වන විදුලි පෝරණුව අළුත්වැඩියාව 2021 වර්ෂයේ නිම කිරීමට නියමිත බව හා මෙම යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියාව සඳහා වගකීම් කාලයක් ලබාගෙන නොමැති අතර රඳවාගැනීම් මුදලක් තබාගෙන ඇති බව. | ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව සියළු වැඩ කොටස් නිම කිරීමට පෙර ගෙවීම් නොකල යුතු අතරම අළුත්වැඩියා වියදම ඉහල වටිනාකමක් වන බැවින් රඳවා ගැනීම් මුදල ප්‍රමාණවත් නොවන බව හා උපකරණ වෙනුවෙන් වගකීම් කාලයක් හෝ නඩත්තු කාලයක් ලබාගත යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ශිල්ප සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 262 ක් හා , තත්‍ය කාර්ය මණ්ඩලය 207 ක් වූ අතර 62 ක පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතුණි. ආයතන සංග්‍රහයේ 13.3 ඡේදය ප්‍රකාරව වැඩබැලීමේ පත්වීමක් ලබාදිය හැක්කේ නිත්‍ය පත්වීම සිදුකරන තෙක් තාවකාලිකව වන අතර එය උපරිමව මාස 3 කලයකට සීමා වියයුතු වුවත් තනතුරු 4 ක් සඳහා නිළධාරීන් 6 දෙනෙකු වසර 2 ක පමණ කාලයක සිට වැඩබැලීම සඳහා පත්කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | ආයතනයේ අරමුණු නොපිරිහෙලා ශිල්පීන්ට ඉටු කිරීම සඳහා අනුමත සහ ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට ඉහළ කළමනාකරණය ක්‍රියා කළ යුතුය |

### 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1. අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ විගණන විමසුම් නිකුත් කිරීම වෙනුවට අභ්‍යන්තර විගණන වාර්තා 07 ක් නිකුත් කර තිබුණි. එයට අදාළව අභ්‍යන්තර චක්‍රලේඛ 04 ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් මෙම චක්‍රලේඛ නිකුත් කර නොතිබුණි | පිළිතුරු ලබාදී නොමැත | අභ්‍යන්තර විගණන වාර්තා මත පදනම්ව චක්‍රලේඛ නොපමාව නිකුත් කලයුතු මෙන්ම එම සොයා ගැනීම් ආයතනයේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමටත්, කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ අනුමත අයැවය ලේඛනය, මූල්‍ය ප්‍රකාශන සමඟ පරීක්ෂා කිරීමේදී වැය විෂයයන් 06 කට අදාළව එකතුව රු.9,096,034ක් ඇස්තමේන්තු වටිනාකම ඉක්මවා වියදම් දරා තිබුණි. එම වෙනස සියයට 29 සිට සියයට 334 දක්වා පරාසයක පැවතුණි. එම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | 2021 වර්ෂයේ අයවැයගත සීමාව ඉක්මවා වියදම් නොදැරීමට නිලධාරින් දැනුවත් කර ඇති බව | අයවැය ඇස්තමේන්තුගත සීමාවන් තුළ වියදම් දැරීමට ක්‍රියා කළ යුතුය. |